මගේ අංකය : **TF/AD/RD/07/24**
2026-05-22 දින.

<u>**රුක්මණි දේවි රඟහලේ අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා මිළ ගණන් කැඳවීම**</u>

ටවර් හෝල් රඟහල පදනමට අයත් මීගමුවේ පිහිටි රුක්මණි දේවි රඟහලේ අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා මිළ ගණන් කැඳවීමට පාලනාධිකාරිය තීරණය කර ඇත.

මීගමුවේ පිහිටි රුක්මණි දේවි රඟහල,රුක්මණි දේවි මාවත,මීගමුව වෙත ගොස් ස්ථානීය පරීක්ෂාකර බලා රු.500.00 ක මුදලක් ගෙවා ලංසු පත්‍රිකාව ලබා ගත හැකි අතර, එම ලංසු පත්‍රිකාව සම්පූර්ණකර මුද්‍රා තැබූ මිළ ගණන් වර්ෂ 2026.06.12 දින ප.ව.2.30 ට පෙර **"සභාපති ,ප්‍රසම්පාදන කමිටුව,ටවර් හෝල් රඟහල පදනම, සච්සිරිපාය, අංක 123, විජේරාම මාවත, කොළඹ -07 "** යන ලිපිනයේ පිහිටි ටවර් හෝල් රඟහල පදනම ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් බහාලනයට අතින් ගෙනැවිත් හෝ එදින ප.ව.2.30 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මිළ ගණන් ලබාගැනීම අවසන් වූ සැනින් මිළ ගණන් විවෘත කරනු ලබයි. ප්‍රමාද වී ලැබෙන මිළ ගණන් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසු විවෘත කරන අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් අයෙකුට සහභාගී විය හැකිය.

මිළ ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ **"රුක්මණි දේවි රඟහලේ සංවර්ධන කටයුතු සඳහා මිළ ගණන්" ලෙස සඳහන් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.**

**නිපුණ දිසානායක**
අධ්‍යක්ෂ(පාලන හා සංවර්ධන)
**දූ.ක. : 0112682324**
**ෆැක්ස් අංකය : 0112678517**
**විද්‍යුත් තැපැල : towersl@sltnet.lk**